චක්‍රලේඛ අංක: 01 - 36 / 2015

මගේ අංකය: FHB/INBU/2014/03

සෞඛ්‍ය අමාත්‍යාංශය,

"සුවසිරිපාය",

කොළඹ 10.

2014 ඔක්තෝබර් 10

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සියළුම නියෝජ්‍ය අධ්‍යක්ෂක ජෙනරාල්වරුන්

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සියළුම අධ්‍යක්ෂකවරුන්

සියළුම පළාත් , ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්

ශික්ෂණ , පළාත් , මහ රෝහල් අධ්‍යක්ෂකවරුන්

ආයතන ප්‍රධානීන්

ශ්‍රී ලංකාවේ විශේෂඥ රෝහල් සඳහා නවජන්ම සත්කාර මට්ටම් වර්ගීකරණය

පසුගිය දශක කිහිපය පුරා ශ්‍රී ලංකාවේ නවජන්ම සත්කාරය සඳහා වූ සේවාවන් වල වර්ධනයක් දක්නට ලැබේ. බොහොමයක් රෝහල් වල නවජන්ම ළදරුවන්ට විශේෂ සත්කාර හා දැඩි සත්කාර සුරැකුම් සේවාවන් ස්ථාපිත කර ඇත. නව ජන්මියාට අවශ්‍ය අවස්ථාවලදී ශල්‍ය පහසුකම් සැපයුමද පසුගිය වසර කිහිපය තුල දියුණු වී ඇත.

ඉහල අවදානම් තත්ව සහිත නව ජන්මීන් එනම්, නොමේරූ ළදරුවන් හෝ අසාධ්‍ය වෛද්‍යමය හෝ ශල්‍ය වෛද්‍යමය තත්වයන් ගෙන් යුතු ළදරුවන් සඳහා නව ජන්ම සත්කාර පහසුවෙන් ලබා ගත හැකි වීම තුලින් සාර්ථක ප්‍රතිඵල ලබා ගෙන ඇත. 90 දශකය හා ඉන් ඔබ්බට; ගර්භනී භාවයේ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම උදෙසා 1976 March Dimes වාර්තාවට, "ප්‍රාදේශීය පරි ප්‍රසව සත්කාරය" සංකල්පය ඇතුලත් කරන ලදී. මෙම වාර්තාවේ මාතෘ හා නව ජන්ම සත්කාර සේවාව මට්ටම් 3 කට බෙදා දක්වා ඇති අතර ඉහල අවදානම් තත්ව සහිත නව ජන්මීන් ඔවුන්ගේ අවදානම් තත්වයේ බරපතල කම අනුව අවශ්‍ය වන මානව හා අනෙකුත් සම්පත් සහිත මධ්‍යස්ථාන වලට යොමු කිරීමට නිර්දේශ කර ඇත. වර්තමානයේ විශේෂඥ නව ජන්ම වෛද්‍යවරුන් හෝ විශේෂඥ ළමා රෝග වෛද්‍යවරුන් නව ජන්ම ඒකක වල සේවය කරන අතර බොහෝ විශේෂඥ රෝහල් වල නව ජන්මීන් සඳහා දැඩි සත්කාර හා විශේෂ සත්කාර සේවාවන් ස්ථාපිත කර ඇත. දැඩි ලෙස රෝගාතුර වූ නව ජන්මීන්ට සත්කාර සැපයීම වඩාත් මධ්‍යගත වූ ආකාරයෙන් ලබා දීම මගින් සාර්ථක ප්‍රතිඵල අත්කර ගත හැකි බව සාක්ෂි මගින් සනාථ වී ඇත. මෙම මධ්‍යගත වූ ඒකකය මගින් ප්‍රතිකාර කරනු ලබන අසාධ්‍ය නව ජන්මීන් සංඛ්‍යාව වැඩිවන්ම රෝගීන්ගේ ප්‍රගතිය (outcome) ද වැඩි දියුණු වී ඇති බව පෙනී ගොස් ඇත.

අසාධ්‍ය ලෙස රෝගී වූ නව ජන්මීන්ට සේවා සැපයීමට අමතරව ඒ සඳහා විවිධ පහසුකම් ද අවශ්‍ය වන බැවින් මෙම සේවාවන් මධ්‍යගත වූ ස්ථානයක තිබීම වඩාත් ඵලදායී බව පෙනේ.

මින් ඉදිරියට නව ජන්ම සත්කාර සේවාවේ උන්නතිය පිණිස විශේෂඥ රෝහල් සඳහා "නව ජන්ම සත්කාර සේවාව" මට්ටම් අර්ථකතනය කර ඇති අතර එය ඉතා අසාධ්‍ය නව ජන්මීන්ට හා පර්යන්ත රෝහල් වලින් යොමු කරනු ලැබූ නව ජන්මීන්ට සත්කාර සපයන විශාල ඒකක වල තත්වය නගා සිටුවීමට මඟ පෙන්වනු ලබයි.

ශ්‍රී ලංකාවේ විශේෂඥ රෝහල් සඳහා නවජන්ම සත්කාර මට්ටම් 4 ක් හඳුනාගෙන ඇති අතර එක් එක් මට්ටමට තිබිය යුතු අවම පහසුකම් මෙම චක්‍ර ලේඛණයට අමුණා ඇත.

විශේෂඥ රෝහල් සඳහා නවජන්ම සත්කාර මට්ටම් 4 සහ එක් එක් මට්ටමට අදාල අවම උපමාන (පහසුකම් )

අත්සන් කලේ වෛද්‍ය පී ජී මහීපාල ,

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්

පිටපත්:

ලේකම් , සෞඛ්‍ය අමාත්‍යාංශය

අතිරේක ලේකම්, වෛද්‍ය සේවා

ප්‍රධාන ගණකාධිකාරි, සෞඛ්‍ය අමාත්‍යාංශය

සභාපති , ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ විද්‍යායතනය

සභාපති , ශ්‍රී ලංකා නාරි හා ප්‍රසව වෛද්‍ය සංගමය

සභාපති , ශ්‍රී ලංකා පරිප්‍රසව සමාජය

1. <u>III $^{+}$ මට්ටම</u>

අවම උපමාන / පහසුකම්

- හෘද සැත්කම්
- නව ජන්ම ස්නායු ශල්‍ය
- ECMO
- තීස සිසිල් කිරීම
- අධික ලෙස අඩු උපත් බර < 1000 ග්‍රෑම්
- මට්ටම් III පහසුකම්
- මාතෘ දාරක මධ්‍යස්ථානය හා මව්කිරි කලමනාකරණ මධ්‍යස්ථානය

2. <u>III වන මට්ටම්</u>

අවම පහසුකම්/ උපමාන

- නව ජන්ම ශල්‍ය (තෝරාගත් ඒකක)
- සංවාතනය ( CPAP,IPPV, අධි සංඛ්‍යාත + NO)
- හුවමාරු පාරවිලයනය
- සිසිල් කිරීම (තෝරාගත් මධ්‍යස්ථාන වල පමණි )
- උපත් බර < 1250g හෝ > 1250g සමඟ සංකූලතා
- TPN
- සහ මට්ටම II පහසුකම්
- සහ මට්ටම I පහසුකම්
- සහ මාතෘ දාරක මධ්‍යස්ථානය හා මව්කිරි කලමනාකරණ මධ්‍යස්ථානය

3. <u>II වන මට්ටම</u>

අවම පහසුකම්

- කෙටි කාලීන සංඛ්‍යාතනය + CPAP
- අනෙකුත් විශේෂ සත්කාර ළදරු ඒකක පහසුකම්
- මට්ටම් 3 හා 4 සිට නැවත යොමුකරන ළදරුවන් සඳහා සත්කාර පවත්වාගෙන යාම
- Intensive phototherapy
- උපත් බර > 1250g සංකූලතා රහිත
- 

4. <u>I වන මට්ටම</u>

අවම පහසුකම්

- ආහාර ගැනීමේ ගැටළු - නල
- Nasal prong $O_2$
- Phototherapy – Single
- ආසීනකාරක සත්කාර /උණුසුම
- අන්ත: ශිරා දියර/ තරල
- අන්ත: ශිරා ප්‍රතිජීවක
- ශරීරයේ සීනි ප්‍රමාණය අඩුවීම කළමනාකරණය
- උණුසුම සුරැකුම
- ස්ථාවර කිරීම හා ප්‍රවාහනය

* පූර්ව ප්‍රසව සමයේ යොමු කිරීම මට්ටම් III මධ්‍යස්ථාන වලට අනිවාර්යය වේ. දරු ප්‍රසවයෙන් පසු සංකූලතා නොමැති නම් මට්ටම් II හෝ I යැවිය හැක.

සත්කාරයේ මට්ටම් සමග පහත පරිදි රෝහල් ලැයිස්තුගත කෙරේ.

| රෝහල් නාම ලේඛණය | හදුනාගත් සත්කාර මට්ටම |
|---|---|
| බස්නාහිර පළාත | |
| රිජ්වේ ආර්යයා ළමා රෝහල | III+ |
| උතුරු කොළඹ ශික්ෂණ රෝහල | III |
| දකුණු කොළඹ ශික්ෂණ රෝහල | III |
| ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල | III |
| ද සොයිසා කාන්තා රෝහල | III |
| කාසල් විදියේ කාන්තා රෝහල | III |
| කළුතර මහා රෝහල | III |
| ගම්පහ මහා රෝහල | II |
| මීගමුව මහා රෝහල | II |
| මූලික රෝහල ඒ පානදුර | II |
| මූලික රෝහල ඒ අවිස්සාවේල්ල | II |
| මූලික රෝහල ඒ හෝමාගම | II |
| මූලික රෝහල ඒ වතුපිටිවෙල | II |
| මූලික රෝහල ඒ හොරණ | II |
| මූලික රෝහල බී මුල්ලේරියාව | I |
| | |
| දකුණු පළාත | |
| කරාපිටිය ශික්ෂණ රෝහල | III+ |
| මහමෝදර ශික්ෂණ රෝහල | III |
| මාතර මහා රෝහල | II |
| හම්බන්තොට මහා රෝහල | III |
| මූලික රෝහල ඒ බලපිටිය | II |
| මූලික රෝහල ඒ තංගල්ල | II |
| මූලික රෝහල ඒ ඇල්පිටිය | II |
| මූලික රෝහල බී කඹුරුපිටිය | I |
| මූලික රෝහල බී තිස්සමහාරාමය | I |
| මූලික රෝහල බී දෙනියාය | I |
| මූලික රෝහල බී වලස්මුල්ල | I |
| මූලික රෝහල බී උඩුගම | I |
| | |
| සබරගමුව පළාත | |
| රත්නපුර පළාත් මහා රෝහල | III |
| කෑගල්ල දිස්ත්‍රික් මහා රෝහල | II |
| මූලික රෝහල ඒ ඇඹිලිපිටිය | II |
| මූලික රෝහල බී මාවනැල්ල | I |
| මූලික රෝහල බී බලංගොඩ | I |
| මූලික රෝහල බී කහවත්ත | I |
| මූලික රෝහල බී කරවනැල්ල | I |
| මූලික රෝහල බී වරකාපොල | I |
| මූලික රෝහල බී කලවාන | I |
| | |

| | |
|---|---|
| වයඹ පළාත | |
| කුරුණෑගල පළාත් මහා රෝහල | III |
| හලාවත දිස්ත්‍රික් මහා රෝහල | II |
| මූලික රෝහල ඒ කුලියාපිටිය | II |
| මූලික රෝහල ඒ පුත්තලම | II |
| මූලික රෝහල ඒ නිකවැරටිය | I |
| මූලික රෝහල බී මාරවිල | II |
| මූලික රෝහල බී දඹදෙණිය | I |
| මූලික රෝහල බී ගල්ගමුව | I |
| | |
| උතුරු මැද පළාත | |
| අනුරාධපුර ශික්ෂණ රෝහල | III |
| පොලොන්නරුව දිස්ත්‍රික් මහා රෝහල | III |
| මූලික රෝහල බී පදවිය | II |
| මූලික රෝහල බී තඹුත්තේගම | I |
| මූලික රෝහල බී මැදිරිගිරිය | I |
| | |
| මධ්‍යම පළාත | |
| මහනුවර ශික්ෂණ රෝහල | III |
| පේරාදෙණිය ශික්ෂණ රෝහල | III |
| සිරිමාවෝ බණ්ඩාරණායක ළමා රෝහල | III+ |
| නුවර එළිය දිස්ත්‍රික් මහා රෝහල | III |
| මාතලේ දිස්ත්‍රික් මහා රෝහල | II |
| නාවලපිටිය දිස්ත්‍රික් මහා රෝහල | II |
| මූලික රෝහල ඒ ගම්පොල | II |
| මූලික රෝහල ඒ දඹුල්ල | II |
| මූලික රෝහල ඒ දික්ඔය | II |
| මූලික රෝහල බී රිකිල්ලගස්කඩ | II |
| මූලික රෝහල බී තෙල්දෙණිය | I |
| | |
| ඌව පළාත | |
| බදුල්ල පළාත් මහා රෝහල | III |
| මොනරාගල දිස්ත්‍රික් මහා රෝහල | II |
| මූලික රෝහල ඒ දියතලාව | II |
| මූලික රෝහල ඒ මහියංගනය | II |
| මූලික රෝහල බී වැලිමඩ | I |
| මූලික රෝහල බී සියඹලාණ්ඩුව | I |
| මූලික රෝහල බී බිබිලේ | I |
| | |

| නැගෙනහිර පළාත | |
|---|---|
| මඩකලපුව ශික්ෂණ රෝහල | III |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහා රෝහල | II |
| අම්පාර දිස්ත්‍රික් මහා රෝහල | II |
| මූලික රෝහල ඒ කල්මුනේ උතුර | II |
| මූලික රෝහල ඒ කල්මුනේ | II |
| මූලික රෝහල ඒ කන්තලේ | II |
| මූලික රෝහල බී කින්නියා | I |
| මූලික රෝහල බී සමන්තුරේ | I |
| මූලික රෝහල බී අක්කරයිපත්තු | I |
| මූලික රෝහල බී දෙහිඅත්තකන්ඩිය | I |
| මූලික රෝහල බී මුතූර් | I |
| මූලික රෝහල බී වාලච්චෙනි | I |
| මූලික රෝහල බී මහඔය | I |
| | |
| උතුර පළාත | |
| යාපනය ශික්ෂණ රෝහල | III+ |
| වව්නියාව දිස්ත්‍රික් මහා රෝහල | II |
| කිලිනොච්චි දිස්ත්‍රික් මහා රෝහල | II |
| මන්නාරම දිස්ත්‍රික් මහා රෝහල | II |
| මුලතිව් දිස්ත්‍රික් මහා රෝහල | II |
| මූලික රෝහල ඒ පේදුරුතුඩුව | I |
| මූලික රෝහල ඒ තෙල්ලිපලෙයි | I |
| මූලික රෝහල බී කයිට්ස් | I |
| මූලික රෝහල බී චෙට්ටිකුලම් | I |
| මූලික රෝහල බී චාවකච්චේරි | I |
| | |